**පාතදුම්බර ප්‍රාදේශිය සභාව**

**මහනුවර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 31 දිනද , ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2010 පෙබරවාරි 26 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1:3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට පාතදුම්බර ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාර්ත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2010 වර්ෂය අවසානයට ලැබිය යුතුව ඇති උසාවි දඩ මුදල රු. 189,588 ක් වන අතර,එය රු. 202,276 ක් ලෙස ගිණුම් ගත කිරීමේ හේතුවෙන් ආදායම් සහ ආදායම් ණයගැතියෝ රු.12,688 ක් වැඩියෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂය තුල මිලදී ගන්නා ලද රු. 12,270 ක වටිනාකමින් යුත් ලිපිද්‍රව්‍ය හා කාර්යාල උපකරණ, ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනගත කර තිබු හෙයින්, ස්ථාවර වත්කම් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් පෙන්නුම් කෙරේ.

(ඇ) පෙර වර්ෂ වලදී මිලදී ගත් රු. 230,775 ක වටිනාකමින් යුත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ ප්‍රාග්ධනිත නොකර ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඈ) 2010 දෙසැම්බර් 31 දිනට රු. 42,054 ක අත ඉතිරිය ශේෂ පත්‍රයේ නිලධාරීන් වෙත ඇති මුදල් යටතේ අනාවරණය කිරීමෙන් තොරව මහජන බැංකු ගිණුම් ශේෂයට ගලපා තිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුම් ශේෂයට සමාන විය යුතු නමුත්, එම ගිණුම් අතර රු. 153,000 ක වෙනසක් පැවතුණි.

(ඊ) ඉඩම් හුවමාරු මත අය කරන ලද මුද්දර ගාස්තු වෙනුවෙන් කාර්ය මණ්ඩලයට දිරි දීමනා සඳහා ගෙවිය යුතු රු. 17,825 ක් වෙනුවෙන් ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ ඉදිකිරීම් අවසන් කර සහ වැඩිදියුණු කර තිබූ රු. 1,019,847 ක් වටිනා ගොඩනැගිලි 05 ක අගය ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඌ) ඉකුත් වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලට අදාල රු.37,308 ක ඉන්ධන බිල්පත් පූර්වර්ථන වර්ෂයේ වැය ශීර්ෂ හර කර ගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(එ) 2001 සැප්තැම්බර් 01 දින සිට 2009 වර්ෂයේ සැප්තැම්බර් දක්වා කාලයට අදාල පෙර පාසැල් ගුරුවරියක් සඳහා සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද රු.74,210 ක හිඟ වැටුප් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදනය කර නොතිබුණි.

1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

ගිණුම් විෂයයන් 04 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 18,726,436 ක් වූ අතර , උපයෝගී ලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 19,693,875 ක් විය.

1.3.3 ගෙවිය යුතු ගිණුම්

-------------------

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 387,424 ක් විය.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 10,774,677 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති , රෙගුලාසි විධිවිධාන වලට හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීත, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) <u>අංක 2006/10 දරණ දේශීය ආදායම් පනත</u><br>153 ජේදය | විදි ලාම්පු උපකරණ මිලදී ගැනිමට අදාලව රු. 4,784 ක රඳවා ගැනිමේ බදු මුදල් , දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. |
| (ආ) 2009 සැප්තැම්බර් 18 දිනැති හා අංක පීඑෆ්/437 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සියළුම රක්ෂණ ආවරණයන් සීමා සහිත ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවෙන් හෝ රක්ෂණ භාර අරමුදලෙන් පමණක් ලබා ගත යුතු බවට උපදෙස් දී තිබියදි, එම උපදෙස් වලට පටහැනිව රු. 19,460 ක් වැය කර බාහිර ආයතනයකින් රක්ෂණ ආවරණයක් ලබා ගෙන තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,656,591 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 774,315 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | | රු. '000 | රු. '000 | රු. ' 000 | රු. '000 | රු. '000 | රු. '000 |
| (i.) | වරිපනම් බදු | 3,100 | 3,078 | 1,433 | 2,700 | 2,410 | (290) |
| (ii.) | බදු කුලී | 2,138 | 1,450 | 650 | 1,255 | 1,423 | 168 |
| (iii.) | බලපත්‍ර ගාස්තු | 1,587 | 1,483 | - | 1,232 | 1,549 | 317 |
| (iv) | වෙනත් ආදායම් | 16,911 | 10,785 | 515 | 10,816 | 12,975 | 2,159 |

#### 2.2.2 උසාවි දඩ මුදල්

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණ 03ක් විසින් 2010 දෙසැම්බර් 31 දක්වා අයකර ප්‍රධාන ලේකම් වෙත එවා ඇති රු. 202,276 ක දඩ මුදල් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 මුද්දර ගාස්තු

2010 දෙසැම්බර් 31 දිනට රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් රු.9,051,830 ක මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

2.2.4 හිඟ හිටි වරිපනම් බදු

සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.1,516,374 ක් වූ හිඟහිටි වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1) (අ) විධිවිධානය අනුව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 හිඟ බදු කුලී

ගිවිසුම් ප්‍රකාරව බදු කුලී අයකර ගැනීමට කටයතු නොකිරීම නිසා 2009 වර්ෂයේ සිට බදුකරුවන් 18 දෙනෙකුගෙන් අය විය යුතු රු.501,584 ක කඩ කුලියක් පැවතුණි.

2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාළ විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| පුනරාවර්තන වියදම් | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| | '000 | '000 | ' 000 | '000 | '000 | '000 |
| පෞද්ගලික පඩිනඩි | 21,298 | 16,743 | 4,555 | 19,257 | 17,762 | 1,495 |
| අනෙකුත් | 13,163 | 8,488 | 4,675 | 12,657 | 6,730 | 5,927 |
| උප එකතුව | 34,461 | 25,231 | 9,230 | 31,914 | 24,492 | 7,422 |
| ප්‍රාග්ධන වියදම | 20,400 | 25,911 | (5,511) | 11,810 | 30,906 | (19,096) |
| මුළු එකතුව | 54,861 | 51,142 | 3,719 | 43,724 | 55,398 | (11,674) |

## 2.4 ප්‍රතිපාදන මුළුමනින්ම ඉතිරි කිරීම

2010 වාර්ෂික අයවැය ලේඛනය මගින් වැය විෂයයන් 05 ක් සඳහා සලසා දී තිබූ රු.912,500 ක ප්‍රතිපාදන අදාල කාර්යයන් සඳහා යොදා නොගෙන මුළුමනින්ම ඉතිරිකර තිබුණි.

## 2.5 මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|
| මාණ්ඩලික | 2 | 2 |
| ද්විතීයක | 27 | 24 |
| ප්‍රාථමික | 27 | 24 |
| වෙනත්(අනියම්, තාවකාලික) | - | 11 |

## 2.6 වත්කම් කළමනාකරණය

### 2.6.1 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

වර්ෂ 02 කට වඩා පැරණි වටිනාකම රු.96,490 ක්වූ නිශ්ක්‍රීයව හා ඌන උපයෝජිත වත්කම් විෂයයන් 04 ක් පැවති බව නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය.

### 2.6.2 ලැබිය යුතු ගිණුම්

2010 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු. 29,253,019 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන්හි එකතුව රු. 163,155 ක් විය.

2.6.3 අයවීමට ඇති සේවක ණය

2010 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු.4,243,429 ක් වූ අතර, අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිටි ගිණුම් ශේෂවල එකතුව රු. 39,557 ක් විය.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) ආයුර්වේද වෛද්‍ය නිලධාරි සඳහා 2007 වර්ෂයට අදාලව ගෙවන ලද රු.13,200 ක හිඟ වැටුප් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ආ) බල ප්‍රදේශය තුල වීථි පහන් අලෝක කිරීම වෙනුවෙන් දරන ලද රු. 39,000 ක මුදල ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ඇ) 2002 වර්ෂයේ දුරකථනයක් ලබා ගැනීම සඳහා නියෝජිත තැපැල් කාර්යාලයක තැන්පත් කර තිබූ රු. 25,000 ක මුදලක් ආපසු ලබා ගැනීමට නොහැකිවී තිබුණි.

2.8 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් පාලනය
(ඇ) ණයගැති හා ණයහිමි පාලනය